

ප්‍රතිඵල ලබාගෙන එම ප්‍රතිකර්ම තවදුරටත් ඉදිරියට නොකඩවා පවත්වා ගෙන යෑමට අපි ගාවට එනවා, ඒ පළමුවන කණ්ඩායම. ලංකාවේ වෙසෙන තමන්ගේ හිතමිතුරන් යම් රෝග වලින් සුව වූ විට, ඒ කෙසේද්‍යයි යන්න දැනගෙන ඒ රෝගයම තමන්ටත් වැළදී ඇතිනම් එම වෛද්‍යවරයා කවුදැයි යන්න සොයා ගෙන යන්නට පෙළඹෙනවා, මේ තවත් එක් කණ්ඩායමක්.

ඕස්ට්‍රේලියාවේ වෛද්‍යවරු පුහුණු කරන අය සමහර වෙලාවට සහතික කරලා කැඩුම් බිඳුම් රෝගීන් බොහෝ වෙලාවට මා ගාවට එවනවා. ඒ අයට පුදුමයි ඒ අය සුව කරන්නට නොහැකි වූ රෝගීන් අපි සුව කිරීම ගැන. මම කියනවා ඒ අයට ඔයාලගේ දණහිස් ශල්‍යකර්මය කරන්න උවමනාවක් නැහැ, හොඳට ඇවිදින්න පුළුවන් කියල වෛද්‍යවරයාට කියන්න කියලා. සමහර බටහිර වෛද්‍යවරුන් ඔවුන්ගේ මුල් බැසගත් අදහස් නිසා ආයුර්වේදය පිළිගන්නගේ නැහැ. නමුත් තරුණ පරම්පරාව එසේ නොවේ. අපි ආඩම්බර වෙනවා අපේ දේශීය වෛද්‍ය ක්‍රමයන් ගැන. සමහර බටහිර වෛද්‍යවරුත් දේශීය වෛද්‍ය ක්‍රමයේ තියෙන සමහර ප්‍රතිකර්ම ගැන සැහීමකට පත්වෙලා රෝගීන් අපවෙත යොමු කරන අවස්ථාත් තියෙනවා. තවත් සමහරුන් ඉන්දීය ආයුර්වේද වෛද්‍යවරුන් ගාවට ගොස් ඒ රෝගය සුව කරගන්නට නොහැකි වූ විට අපි ගාවට එන පිරිසකුත් සිටිනවා. ඉන්දියන් පංච ක්‍රමයේදී පත්තු යොදා ගැනීම බොහොම අඩුවෙන් කරන්නේ. නමුත් අපි මුලින්ම කරන්නේ පත්තුව යොදන එක. තවත් එක් දෙයක් ඔවුන් රස බෙහෙත් යොදා ගැනීම බොහෝම අඩුයි. අපි රස බෙහෙතුත් යොදා ගෙන ප්‍රතිකර්ම කරනවා.

*ඔබ 'රස බෙහෙත්' යනුවෙන් අදහස් කරන්නේ මොනවද?*

ආයුර්වේද වෛද්‍ය ක්‍රමයෙ රස වාජීකරණ නමින් වෙනමම කොටසක් තියෙනවා. ඒවා හරිම ඉක්මන් ක්‍රියාකාරීත්වයක් තියෙන්නේ. උදාහරණයක් ලෙස ගත්විට අපිට සෙම තියෙන විට අපි ඇන්ටිබයෝටික්ස් ගන්නවා දවස් හතක්. නමුත් ආයුර්වේද වෛද්‍ය ක්‍රමයේ තියෙනවා 'සමීර පන්නය' නමින් බෙහෙතක්. මෙය දවස් තුනක් ගත්විට සෙම් රෝගය සුව වෙනවා. නමුත් මෙය දවස් හතක් එකදිගට පාවිච්චි කලොත් වඩාත් හොඳයි. මෙවැනි බෙහෙත් ඉන්දියානු වෛද්‍ය ක්‍රමයේ නැහැ. 'සමීර පන්නය' අපටම ආවේණික දේශීය බෙහෙතක්. ලංකාවෙත් මෙම බෙහෙත හඳුන්න දන්න වෛද්‍යවරු දෙදෙනෙකු පමණයි සිටින්නේ. වාසනාවට එක් වෛද්‍යවරයෙක් මගේ ගුරුවරයෙක්.

*ඕස්ට්‍රේලියාව වැනි තද නීති තියෙන රටකට මෙවැනි බෙහෙත් ඔබ ගෙන්වන්නේ කෙසේද? එය ඔබට අභියෝගයක් වුනේ නැතිද?*



ඇත්තටම ඕස්ට්‍රේලියාවේ තිබෙන දේශීය හා විදේශීය ඖෂධ පනත යටතේ ගෙන්වන්නට අසීරුයි. මෙහි තිබෙන දේශගුණයත් සමග මෙහි තිබෙන වගාවන්ට හානි වන දිලීර, කෘමීන්, විෂබීජ පැතිරීම ඉතාම වේගවත්, ඒ නිසා වගාවන්ට හානි වෙලා තියෙනවා. ඔවුන් එය අත්දැක තියෙනවා. කොන්ටොන් නමැති ගෙඩි විශේෂය එවැනි විදේශීය නෞකාවකින් ආ සත්ව විශේෂයක. ඔවුන් ආහාර දාමයේ මුල ඉඳන් මුළු ආහාර දාමයටම බලපෑම් ඇති කරනවා. ඔවුන් ජනපදයෙන් ජනපදයට සංක්‍රමණය වෙනවා. ඒ නිසා ඔවුන් බියක් දක්වනවා එවැනි විෂබීජයක් මගින් දිලීරයක් තියේවිද, කෘමි ජාතියක් තිබේද කියා. වාසනාවකට වගේ චීන ආයුර්වේද ඖෂධ වලත් අපි ගෙන්වන බෙහෙත් වලත් සමානකම් තියෙනවා. TCMC "Traditional Chinese Medicine" චීන බෙහෙත් ගෙන්වන ඒ වෛද්‍යවරුන්ගේත් උදව් ඇතිව ඒ ආනයනය මියකියවිලි ඇතුලත් කරල තමා මේ බෙහෙත් ගෙන්වන්නේ. අපිට ඇත්තටම ප්‍රශ්නයකුත් වෙලා තියෙනවා. ආයුර්වේදයේ 'සද්ධරණී' නම් ගුලියක්' එය අඹරනු ලබන්නේ ගවමූත්‍ර යොදා ගෙනයි. එම නිසා මෙහි පෙට්ටි විවෘත කළ විට මුළු පළාතේම දුර්ගන්ධයක් පැතිරෙනවා. රටත් වැඩියෙන් මේ බෙහෙත බානකොට බල්ලන් උඩු බුරලනවා. මෙම බෙහෙත පළවෙනි වර ගෙන්වන්නට මට නොහැකි වුණා. ඒ ඔක්කොම ඉවත දැමීමට පමණක් නොව අඩි හයක් යටට දාලා පුච්චලා අඩි හයක් යටින් එම අළු තැන්පත් කරන්න වුණා. එහි වැඩ කරන අයගේ පවුලේ උදවිය ඇවිත් ඒ අයගේ රෝග සුව කළ බව කියූ නිසාම මට දෙවන වර ඒ බෙහෙත ගෙන්වන්න පුළුවන් වුණා.

*වෛද්‍යතුමනි අපි රළුග කලාපයෙන් තුමන රෝගයක් ගැනද කතා කිරීමට බලාපොරොත්තු වෙන්නේ?*

ඕස්ට්‍රේලියාව කියන්නේ ශීත රටක්. එමනිසා ආතරයිටීස්, රූමටොල්ඩ් ආතරයිටිස් සහ ආමවාත කොටස් ශීත කොටස් ලෙස නම් කෙරෙනවා. ඒවායේ තිබෙන ශීත ගතිය වැඩියි. චීස්, යෝගට්, කිරි සහිත ආහාර තමා ශීත කාලයේදීත් වැඩි වශයෙන් අහාරයට ගනු ලබන්නේ. මේ ආහාර ගැනීම නිසා ඇගේ තියෙන ශීත බව තවත් වැඩි වෙනවා. ඒ නිසා ආහාර ජීරණයේ තිබෙන දුර්වලතා නිසා ආමය නැති වෙනවා. මෙය අර්ථ කථනය කරන්නේ නොපැසුණු ආහාර රසය නිසා ජීරණ පද්ධතියේ දෝෂ හට ගැනීම නිසා තමා මේ ආමය ලේවලට එකතු වීමයි. රුධිරයත් සමග ආමය පොඩි සන්ධි කොටස් වල තැන්පත් වී ලේ ගමනාගමනය දුර්වල කරවනවා. එවිට මේ ආතරයිටීස් යන තත්වය ඇතිවෙනවා. මේ නිසා ලොකු වේදනාවක් ඇති වෙනවා. රූමටොල්ඩ් ආතරයිටීස්, බර්සයිඩීස්, හන්දි ඉදිමීම, අවබාහුකතාවය, ගුදුෂවාතය යන වාතරෝග ඇතිවෙනවා. දැන් බොහෝ තරුණ කොටස් වලටත් ආතරයිටිස් යන රෝගය වැළඳෙනවා. වෛද්‍යවරුන්ටත් රෝග විනිශ්චය කරන්නට නොහැකි වෙනවා. මේවා හොඳ කිරීමේ ශක්තිය හා බෙහෙත් තිබෙන්නේ ආයුර්වේදයේ පමණයි.

*ආයුර්වේද ශිල්පය මෙම රටට ගෙනවිත් ශ්‍රී ලාංකිකයනට වගේම ඕස්ට්‍රේලියානු ජාතිකයන් සමග බෙදාහදා ගැනීම ගැන ඔබට අපගේ හෘදයාංගම ස්තුතිය පුදකරනවා. ඔබට බොහොම ස්තුතියි.*